## The spoken word in faith (Sam J 24Feb19)

## ඇදහිල්ලෙන් කථාකළ වචනය

මතෙව් 8:5-13 යේසුස්වහන්සේ කපර්ණවුමට ඇතුල්වූ කල්හි, සියයකට මුලාදෑනියෙක් උන්වහන්සේ ළඟට ඇවිත්,
උන්වහන්සේට කන්නලව්කරමින් : 6 ස්වාමිනී මාගේ මෙහෙකරුවා අංශභාග රෝගීව බලවත් ලෙස වේදනා විඳිමින් ගෙයි
ඔත්පලව සිටීයයි කීවේය. 7 මම ඇවිත් ඔහු සුවපත් කරමියි උන්වහන්සේ ඔහුට කීසේක. 8 සියයකට මුලාදෑනියා
උත්තරදෙමින්: ස්වාමිනී, මාගේ පියස්ස යටට ඔබගේ ඊමට මම නොවටිමි. වචන මාත්‍රයක් පමණක් කිව මැනව, එවිට
මාගේ මෙහෙකරුවාට සුවවන්නේය. 9 මක්නිසාද මමත් ආණ්ඩු බලයට යටත් මනුෂ්‍යයෙක්ය, මා යටතෙහිද හේවායෝ
සිටිති. එක්කෙනෙකුට මා යවයි කී කල, ඔහු යන්නේය; තව කෙනෙකුට මා එවයි කී කල ඔහු එන්නේය; මාගේ දාසයාට
මේක කරවයි කී කල ඔහු ඒක කරන්නේයයි කීවේය. 10 යේසුස්වහන්සේ ඒ අසා, මවිතව, තමන් අනුව එන්නන්ට
කථාකොට; සැබවක් නුඹලාට කියමි, ඉශ්‍රායෙල්හිවත් මෙබඳු මහත් ඇදහිල්ලක් නුදුටිමි. 11 තවද නුඹලාට කියමි:
නැගෙනහිරින්ද බස්නාහිරින්ද බොහෝ දෙනෙක් ඇවිත්, ආබ්‍රහම්ද ඊසාක්ද යාකොබ්ද සමග ස්වර්ග-රාජ්‍යයෙහි
හිඳගන්නෝය. 12 එහෙත් රාජ්‍යයෙහි පුත්‍රයෝ පිටත අඳුරෙහි දමනු ලබන්නෝය. එහි හැඬීමද දත්මිටිකෑමද වන්නේයයි
කීසේක. 13 යේසුස්වහන්සේ සියයකට මුලාදෑනියාට කථාකොට: පලයන්න, "නුඹ අදහාගත් ලෙසම නුඹට වේවා"යි කීසේක.
ඒ පැයේදීම මෙහෙකරුවා සුවපත්විය.

නරක අවස්ථාවක් තුළින් යම් යහපත් දෙයක් ගෙන එන පිණිස යේසුස්වහන්සේ කොපමණ දුරක් යන්නට කැමතිද කියා මේ කතන්දරයෙන් පෙන්වයි. යොහන් 3:16 යේසුස්වහන්සේ කෙරෙහි අදහාගන්න සෑමදෙනාම විනාශ නොවී සදාකාල ජීවනය ලබන බව අපට පවසයි.

රෝම හමුදා නිලධාරියා - රෝමවරු යුදෙව්වන් පාලනය කරමින් ඔවුන්ට පීඩා කළහ. ඔවුන් කෙසේවත් යුදෙව්වන් අතරේ ජනප්‍රිය නොවූහ.

ඇසීමෙන් ඇදහිල්ල පැමිණෙයි. එබැවින්, මට විශ්වාසයි මම ගිය සතියේ කතා කළ ආකාරයට යේසුස්වහන්සේ ළඟට ගියොත් ඔහුගේ අවශ්‍යතාවය සම්පූර්ණ වෙනු ඇතැයි, ලාදුරු රෝගියා සිතූ ලෙස මේ හමුදා නායකයාත් යේසුස්වහන්සේ සහ උන්වහන්සේ මිනිසුන් අතරේ කරමින් සිටි හාස්කම් ගැන අසා තිබෙන්නට ඇති.

මිනිස්සු ඔහු ගැන සිතන්නේ මොනවාද කියා නොසිතා, රෝගීව සිටි ඔහුගේ මෙහෙකරුවා වෙනුවෙන් ඒ සියල්ල බිඳගෙන යේසුස්වහන්සේගෙන් උදව් ඉල්ලාගෙන යාම, රෝම හමුදා නිලධාරියෙකුට කරන්නට හැකිවූ ඇදහිල්ලේ ක්‍රියාවක්ම විය.

1 කථාකළ ඇදහිල්ලේ බලය ඔබ තුළ ඇත - පවුල සහ මිතුරන්ට අමාරුකම් සහ අවශ්‍යතාවයන් ඇති අවස්ථාවලදී ඔවුන් වෙනුවෙන් අපට සිට ගැනීමට සිදුවන අවස්ථාවලට බොහෝවිට අප මුහුණ දී ඇතැයි මම සිතනවා. අපූරු වෙනස නම් යේසුස්වහන්සේගේ මරණය සහ නැවත නැගිටීම තුළින්, ඇදහිල්ලේ වචන කථා කිරීමට සහ අපූරු ප්‍රතිපල දැකීමට අපට බලය තිබීමයි. 8 වන පදය සියයකට මුලාදෑනියා යේසුස්වහන්සේට කීවේ වචනයක් පමණක් කතා කරන්න /අණ කරන්න කියායි. ආධිපත්‍යය තිබුණු කෙනෙක් නිසා මේ හමුදා නායකයා ආධිපත්‍යය යනු කුමක්දැයි දැන සිටියේය. ගණන් කළ නොහැකි තරම් හාස්කම් කර තිබුණු බැවින් යේසුස්වහන්සේ මහා අධික බලයක් ඇති කෙනෙක් බව දැනගත් ඔහු එම බලයට අතගැසුවේය.

යේසුස්වහන්සේගේ නාමයේ සහ නැවත නැගිටීමේ බලය තුළින් අපට තිබෙන ආධිපත්‍යය ගැන ඔබ සහ මම දැනගත් විට අපටත් වචනයක් කියා අපේ ඇස් ඉදිරියේ හාස්කම් සිදුවන හැටි දැකිය හැකියි. පළමුකොට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ඔබට තිබෙන ආධිපත්‍යය ඔබ දැන ගත යුතුයි. ලූක් 9:1 යේසුස්වහන්සේ උන්වහන්සේගේ ගෝලයන් කැඳවා ඔවුන්ට සියලුම යක්ෂයන් දුරු කරන්නට සහ සියලුම රෝග සුවකිරීමට, බලය සහ ආධිපත්‍යය දුන්සේක. මතෙව් 10:1 හි එයම සඳහන්වේ.

ඔබ සහ මම, අප තුළ යේසුස්වහන්සේගේ හාස්කමේ ඩයිනමයිට් බලය දරන්නෙමු. අපට දී තිබෙන ආධිපත්‍යය අපි පාවිච්චි කරන විට හාස්කම් සිදුවීම් අපට දැකිය හැකි වෙනු ඇත.

යේසුස්වහන්සේ මෙසේ කීසේක. යොහන් 14:12-14 "සැබවක් සැබවක් නුඹලාට කියමි - මා කෙරෙහි අදහන්නා මා කරන ක්‍රියාත් කරන්නේය; මා පියාණන්වහන්සේ වෙතට යන නිසා මීට වඩා මහත් ක්‍රියාත් ඔහු කරන්නේය. 13 නුඹලා මාගේ නාමයෙන් ඉල්ලන කොයි දෙයක් වුවත්, පුත්‍රයා තුළ පියාණන්වහන්සේ මහිමය ලබන පිණිස මම ඒක ඉෂ්ටකරන්නෙමි. 14 නුඹලා විසින් මාගේ නාමයෙන් කොයි දෙයක් ඉල්ලුවත්, මම ඒක ඉෂ්ටකරන්නෙමි."

යේසුස්වහන්සේ මෙම සත්‍යය සහතික කරනසේක: යේසුස්වහන්සේ කෙරෙහි අදහා ගන්නා අය, විශ්වාසය තබන අය, ඔවුන්ගේ ස්ථිර නිසැකකම තබන අය "මම ඒක නැතිකර ගන්නට යන්නේ නැහැ, මම ඒක අත්හැර දමන්නේ නැහැ, මම මගේ ස්ථානයේ ඇදහිල්ලෙන් සිටින්නට යනවා, මොනවා වුනත් මම අල්ලාගෙනම ඉන්නට යනවා, අවිශ්වාසයේ සහ පරාජය වෙයි කියා සිතෙන භය, යේසුස්වහන්සේ තුළ බලාපොරොත්තුව සහ ඇදහිල්ල බවට පත්කරගෙන, මගේ

ආකල්පය වෙනස්වී මගේ හැසිරීම වෙනස් වෙයි කියා ඇදහිල්ලෙන් විශ්වාස කරමින්, මම නොකඩවාම දිගටම දරාගෙන ඉදිරියටම යනවා" කියන තත්වයකට පත්වෙනු ඇත. අප අත්නොහැර සිටින විට මහත් දේවල් සිදුකරගනු ඇති බවට සහතිකවීමක් තිබේ.

ප්‍රායෝගික අදාලකරගැනීම: ඔබ බලාපොරොත්තු කඩවී, සියල්ල නැතිවී ඇති බව දැනෙන අවස්ථාවකට මුහුණ දෙන විට, හාස්කමක් උදෙසා යේසුස්වහන්සේ කෙරෙහි ඔවුන්ගේ විශ්වාසය, ස්ථිර නිසැකකම සහ ඇදහිල්ල තබන්නට කැමතිවන අයට, බලාපොරොත්තුවක් ඇත. හාලේලූයා! **ඔබේ හාස්කම ඔබේ කටේය!** ඔබට තිබෙන්නේ ඇදහිල්ලෙන් වචන කථාකරන්නටයි.

පුත්‍රයාවන යේසුස්වහන්සේ තුළින් පියාණන්වහන්සේට මහිමය ගෙන එන බැවින් අප ඉල්ලන ඕනෑම දෙයක් උන්වහන්සේ කරන බව යේසුස්වහන්සේ කීසේක. මොනවාගේ පොරොන්දුවක්ද?

අපි ඇදහිල්ලෙන් ඉල්ලනවාද? යේසුස්වහන්සේ කවුද යන සත්‍යය අපි අපේ අමාරු අපහසු තත්වයන් ඉදිරියේ ප්‍රකාශ කරනවාද?

ඇදහිල්ල යනු දැනට ඔබට නොපෙනෙන යම්දෙයක් ගැන එය ලැබෙන්නට යනවා කියන විශ්වාසයෙන් සහ බලාපොරොත්තුවෙන් ඔබ යාච්ඤා කර දෙවියන්වහන්සේ කෙරෙහි තබන විශ්වාසයයි. එය හරියට ඔබට ලැබෙන්නට යන බව ඔබ විශ්වාස කරන, ඔබ ඉල්ලූ දෙයට එන්නට දෙන වේග ශක්තියක් වාගේය. අද අපට රෝගීන් මත අත් තබා යාච්ඤා කළ හැකියි, එවිට ඔවුන් සුව වෙයි. උන්වහන්සේ කළ දේවල් සහ ඊටත් වඩා මහත් දේවල් ද අප කරනවා ඇතැයි යේසුස්වහන්සේ කීසේක. "වඩා මහත්" යන වචනය ග්‍රීක භාෂාවෙන් පරිවර්තනය කර ඇත්තේ "පරිමාව හෙවත් ධාරිතාව, මුළු ප්‍රමාණය" ලෙසය. ඇදහිලිවන්තයන් කරනවා ඇතැයි යේසුස්වහන්සේ කී මහත් දේවල් යනුවෙන් අදහස් වෙන්නේ සභාව තුළින් කෙරෙන සුවවීම් ප්‍රමාණයයි. යේසුස්වහන්සේ එක වෙලාවක එක තැනකට සීමාවී සිටිසේක. ඒත් අද උන්වහන්සේගේ ශරීරය ලෙස සෑම තැනම සිටින කිතුණුවන්ට යේසුස්වහන්සේ කළාට වඩා වැඩියෙන් වැඩ කළ හැක.

මේ පදය සමග අවසන් කරමු. <u>මාර්ක් 16:17-18</u> "අදහන්නන්ට ඇති ලකුණු නම්; ඔව්හු මාගේ නාමයෙන් යක්ෂයන් දුරුකරන්නෝය; අන්භාෂාවලින් කථා කරන්නෝය; සර්පයන් අල්ලා ගන්නෝය, යම් මරණීය වස ජාතියක් බීවත් එයින් කිසිසේත් ඔවුන්ට අනතුරක් නොවන්නේය; ඔවුන් රෝගීන් පිට අත් තැබූ කල්හි, ඔවුන් සුවය ලබන්නෝයයි කීසේක."

ඔබ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ ඇදහිලිවන්තයෙක් නම් ඔබට මේ බලය සහ ආධිපත්‍යය තිබේ.

මෙයට කැමති කවුද? දැන් යේසුස්වහන්සේට තමන්ගේ ජීවිතය භාරදෙන්න කැමති කවුද? මේ ආධිපත්‍යය තුළ ක්‍රියාත්මක වෙන්නට කැමතිවෙන්නේ කවුද?